**ශීර්ෂය 277 - මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 277 - මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූලි 07 දින දිස්ත්‍රික් ලේකම් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 483.32 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රුපියල් මිලියන 474.58 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 8.74 ක් හෙවත් සියයට 1.81 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 429.55 | 429.38 | 0.17 | 0.04 |
| මූලධන | 53.77 | 45.20 | 8.57 | 15.94 |
| **එකතුව** | 483.32 | 474.58 | 8.74 | **1.81** |

**(ආ)** **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 29 ක් හා දෙපාර්තමේන්තු 20 ක් විසින් එකතුව රු.මිලියන 1,356.77 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වනවිට ඉන් රු.මිලියන 1,274.25 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 82.43 ක් හෙවත් සියයට 6.08 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 27701 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** |
| 36.80 | 25.74 | 28.80 | 30.74 | 125.00 | 92.91 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 8 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු. මිලියන 454.45 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු. මිලියන** |
| 6000/0000/00/0001/0060/000 | 0.01 |
| 6000/0000/00/0002/0078/000 | 0.74 |
| 6000/0000/00/0011/0602/000 | 300.00 |
| 6000/0000/00/0013/0079/000 | 21.20 |
| 6000/0000/00/0016/0027/000 | 128.19 |
| 6000/0000/00/0017/0009/000 | 0.09 |
| 6000/0000/00/0018/0038/000 | 4.15 |
| 6003/0000/00/0053/0000/000 | 0.07 |
| | 454.45 |

## 2.4 විගණන නිරීක්ෂණය

මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 විගණන විමසුම්වලට පිළිතුරු දීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේ දී ඉදිරිපත් කරන ලද විගණන විමසුමකට 2016 අගෝස්තු 08 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එම විමසුමට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. 3,115,699 ක් වී තිබුණි.

### 3.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

#### 3.2.1 ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් 2015 වර්ෂයේදී හා ඉකුත් වර්ෂවලදී ලැබී තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කර මිලදී ගත් රු.3,898,093ක් වූ වර්ග 53 කට අයත් භාණ්ඩ ඒකක 6370 ක් දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක 2016 මැයි 31 දින වන විටත් ප්‍රතිලාභීන්ට බෙදා නොදී ගබඩාකර තිබුණි.

(ආ) අමාත්‍යාංශය විසින් දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | වැඩසටහන/ ව්‍යාපෘතිය | උපයෝජනය | විගණන නිරීක්ෂණය |
|---|---|---|---|
| | | රු. | |
| බඩල්කුඹුර | 2014 විමධ්‍යගත වැඩසටහන යටතේ සුහ සාධක සමිතියකට විදුලි ජනන යන්ත්‍රයක් ලබා දීම | 67,500 | 3kw ධාරිතාවයෙන් යුත් විදුලි ජනන යන්ත්‍රයක් රු.67,500 ක් ගෙවා මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණද, එම මුදලට එම වෙළඳනාමය යටතේ 2.5kw ක්වූ අඩු ධාරිතාවයෙන් යුත් විදුලි ජනන යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි. |

| | | | |
|---|---|---|---|
| බුත්තල | 2014 විමධ්‍යගත වැඩසටහන යටතේ සමිති සංවිධාන සඳහා ප්ලාස්ටික් පුටු ලබා දීම | 480,256 | ප්ලාස්ටික් පුටුවක් රු.820 බැගින් මිලදීගත හැකිව තිබියදී, රු.1,024 බැගින් පුටු 469 ක් මිලදී ගැනීම නිසා රු.95,676 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| - එම - | 2014 වර්ෂයේ විමධ්‍යගත වැඩසටහන යටතේ බෙදාහැරීමට තහඩු මඩු 17 ක් මිලදී ගැනීම | 816,000 | මිල කැඳවීමේ ලිපිය අනුව 20' x 10' ප්‍රමාණයේ තහඩු මඩු 17 ක් සඳහා එකක් රු.48,000 ක් බැගින් ලංසු එවා තිබුණද, එම මිලට 20' x 8' ප්‍රමාණයේ තහඩු මඩු මිලදී ගෙන තිබුණි. |
| වැල්ලවාය | 2014 වර්ෂයේ දී තෙළුල්ල ජනපදයේ එල් 80 මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය | 874,852 | මෙම කොන්ක්‍රීට් මාර්ගය 2015 ඔක්තෝබර් 22 දින සිදුකළ භෞතික පරීක්ෂාවට අනුව මාර්ගයේ තැනින් තැන හරස් හා දික් අතට පිපිරීම් සිදු වී තිබු අතර ගල් මතුවී වලවල් හැරී භාවිතයට නුසුදුසු තත්ත්වයේ පැවතිණි. |
| වැල්ලවාය | 2014 වර්ෂයේ විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ සමිති සංවිධාන සඳහා භාණ්ඩ ලබාදීම | 770,760 | ප්ලාස්ටික් පුටු 462 ක් හා වානේ අල්මාරි 43 ක් මිලදී ගැනීමේදී තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයකින්ද තොරව අඩු මිල ගණන් නොසලකා හැර වැඩි මිලට මිලදී ගැනීම නිසා රු.107,410 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| මඩුල්ල | 2014 වර්ෂයේ විමධ්‍යගත වැඩසටහන යටතේ මරණාධාර සමිතියකට ලබාදීමට විදුලිජනන යන්ත්‍රයක් මිලදී ගැනීම | 67,950 | 1kw ධාරිතාවයෙන් යුත් විදුලිජනන යන්ත්‍රයක් මිලදී ගැනීම වෙනුවෙන් මුදල් ගෙවා තිබුණද, එම මුදලට එම වෙළඳනාමය යටතේ වූ 0.6 kw අඩු ධාරිතාවයෙන් යුත් විදුලිජනන යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි. |

**3.3 පොදු තැන්පත් ගිණුම**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වර්ෂ 2 ක් ඉක්ම වූ එකතුව රු. 585,990 ක් වූ රඳවා ගත් මුදල් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් විවිධ කාර්යයන් සඳහා ලබා දී තිබූ රු.104,152,020 ක් අදාළ කාර්යභාරයන් ඉටු නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඇ) ධාන්‍ය නිෂ්පාදනය සඳහා චක්‍රීය අරමුදලක් පිහිටුවීමට 2014 වර්ෂයේ දී අංක 6000/0000/00/0011/0602 දරන තැන්පත් ගිණුම ආරම්භ කර තිබුණද, 2015 දෙසැම්බර් 31 දින වන විටත් එම ගිණුම අක්‍රීය තත්ත්වයේ පැවතුණි.

## 3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 27701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 5,227,946 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 16 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

## 3.5 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.5.1 විගණන හා කළමනාකරණ කමිටු

2009 ජූනි 06 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව අවම වශයෙන් කාර්තුවකට වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවත්, මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2015 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් වාර 03 ක් පමණක් පවත්වා තිබුණි.

### 3.5.2 වත්කම් කළමනාකරණය

මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත වර්ග කර ඇති පරිදි වටිනාකම ඉදිරිපත් නොවූ සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|
| | | | වර්ෂ |
| (i) | ඉඩම් (හෙක්ටර්යාර) | 01 | 6 |
| (ii) | ගොඩනැගිලි | 02 | 2 සිට 6 දක්වා |
| (iii) | මෝටර් වාහන | 01 | 10 |
| (iv) | යන්ත්‍ර සූත්‍ර | 02 | 5 සිට 20 දක්වා |

**(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

-----------------------------------------------------

දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතියකින් තොරව බුත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමියේ කොටසක් පෞද්ගලික පැළ තවාන්කරුවෙකුට පැළ අලෙවිසැලක් පවත්වාගෙන යාම සඳහා ලබා දී තිබුණි.

## 3.6 අනුකූල නොවීම්

---------------------

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | |
| (i) 2009 අප්‍රේල් 16 දිනැති අංක 9/2009 දරන චක්‍රලේඛය | - | මැදගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දිවිනැගුම දෙපාර්තමේන්තුවට අයත් නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සලකුණු කිරීමට ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කර නොතිබුණි. |
| (ii) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛයේ "අ"( II ) ඡේදය | - | මඩුල්ල හා සෙවනගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් වාහන 4 ක් සම්බන්ධයෙන් මාස 06 කට වරක් ඉන්ධන දහනයවීම පිළිබඳව පරීක්ෂා කර නොතිබුණි. |
| **(ආ)** දිවි නැගුම චක්‍රලේඛ | | |
| 2015 ජුනි 08 දිනැති අංක 2015/07 දරන දිවි නැගුම චක්‍රලේඛයේ 7 ඡේදය | 1,009,000 | සියඹලාණ්ඩුව දිවි නැගුම කාර්යාලය විසින් දිවිනැගුම ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ භාණ්ඩ මිලදී ගැනිමේදී ප්‍රතිලාභී දායකත්වය අයකර නොගෙන භාණ්ඩවල මුළු පිරිවැය රජය විසින් වැයකර තිබුණි. |
| (ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ | | |
| 2001 මාර්තු 28 දිනැති අංක 395 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 300,239 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5 ක් විසින් ආදායම් සහතික නිකුත් කිරීමේදී දෙපාර්තමේන්තු ගාස්තු අඩුවෙන් අයකර තිබුණි. |

(ඇ) රාජ්‍ය පරිපාලන හා ස්වදේශීය කටයුතු අමාත්‍යාංශයේ ලිපි

| | | |
|---|---|---|
| 2013 ජූලි 05 දිනැති අංක HAF/03/ADMIN/02/002 දරන ලිපියේ 7 ඡේදය | - | සෙවනගල හා බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ග්‍රාම නිලධාරී වසම් තුනක අනවසර අල්ලා ගැනීම් තුනක් සම්බන්ධයෙන් සන්තකය ආපසු ලබාගැනීමේ කටයුතු සිදු කර නොතිබුණි. |

## 3.7 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

### (අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම

ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භ කළයුතු වූ දිනය | ආරම්භ නොකිරීමට හේතු |
|---|---|---|---|
| | රු. | | |
| **බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය** | | | |
| වන සතුන් සඳහා 14 දියවල ඉදිකිරිම | 1,999,974 | 2014.12.05 | ප්‍රතිපාදන පවරා ගැනීම නිසා |
| **බුත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය** | | | |
| උනාවටුන කැටගල් ඇල්ලීම | 490,000 | 2015.10.21 | අයහපත් කාලගුණය නිසා |
| කුමාරගම වසමේ කැඩී ඇති බෝක්කු ප්‍රතිසංස්කරණය කිරීම | 490,000 | 2015.10.20 | අයහපත් කාලගුණය නිසා |

### (ආ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර තිබුණත් එම ව්‍යාපෘති නිම නොකර අතහැර තිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භ කළ දිනය | 2015 දෙසැම්බර් 31 දිනට වියදම | අතහැර දැමීමට හේතු |
| --- | --- | --- | --- | --- |
| ----------- | ------------ | ----------- | ------------- | ---------------------- |
| | රු. | | රු. | |
| **මැදගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය** | | | | |
| --------------------- | | | | |
| වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන යටතේ කොටබෝව දිවුල්දෙන පාරේ දියවලවල් 03 ක් ඉදිකිරීම | 4,880,664 | 2014.11.20 | 334,664 | අධික වර්ෂාව නිසා ව්‍යාපෘති තුනෙහි වැඩ කටයුතු නිම කිරීමට අදාල සමිති අපොහොසත් වීම නිසා ප්‍රතිපාදන පවරා ගෙන ඇත. |
| **බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය** | | | | |
| --------------------- | | | | |
| බඹරකඳුර අසල දියවලවල් ඉදිකිරීම | 1,999,974 | 2014.11.18 | 236,800 | අධික වර්ෂාව නිසා වැඩ කටයුතු නිම කිරීමට අදාල සමිති අපොහොසත් වීම |
| නිල්ගල 14 කනුව අසල දියවල ඉදිකිරීම | 1,999,974 | 2014.12.05 | 255,000 | අධික වර්ෂාව නිසා වැඩ කටයුතු නිම කිරීමට අදාළ කොන්ත්‍රාත්කාර සමිතිය අපොහොසත් වීම |
| අලකොළමඩ කෘෂි පාර මෝටර් ග්‍රේඩර් කිරීම හා බෝක්කු 03 ක් ඉදිකිරීම | 499,814 | 2014.08.01 | 201,200 | වාර්තා කර නොමැත. |
| බුලුපිටිය මහ විද්‍යාලය දක්වා මාර්ගය ග්‍රේවල් කිරීම | 499,814 | 2014.08.01 | 197,200 | වාර්තා කර නොමැත. |
| **මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය** | | | | |
| ------------------ | | | | |
| ඉත්තෑකටුව වාරි වම් ඇල ප්‍රතිසංස්කරණය | 490,000 | 2015.10.26 | 180,046 | අධික වර්ෂාව නිසා වැඩ නිමකිරීමට නොහැකිවීම |

| | | | | |
|---|---|---|---|---|
| කොටිගල්හෙල ප්‍රජා ශාලාව ඉදිකිරීම | 490,000 | 2015.10.23 | 115,243 | ඉදිකිරීම් කරන අවධියේ පැවති අධික වර්ෂාව නිසා. |
| මොනරකැලේවත්ත මාර්ගය | 392,980 | 2015.11.18 | 241,429 | වාර්තා කර නොමැත. |

**(ඇ) මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

**-----------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මැදගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ කළුගහවාඩිය හා බකිනිගහවෙල පටස්ගලවත්ත නළ ලිං ජල යෝජනා ක්‍රම දෙකෙහි විමර්ශන ගාස්තු සහ විදීමේ ගාස්තු වෙනුවෙන් රු.1,501,770 ක් මොනරාගල ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත ගෙවා තිබුණද, 2015 පෙබරවාරි 29 දින වන විටත් නළ ලිං දෙකෙහි ඉදිකිරීම් කටයුතු නිමකර නොතිබුණි.

(ii) වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ දෙමටත්තආර අතුරු මාර්ගයේ පදිංචිකරුවන් සඳහා පානීය ජලය ලබාදීම යටතේ ප්‍රතිලාභීන් 58 දෙනෙකුට ජලමනු ලබා දීම සඳහා 2014 දෙසැම්බර් 31 දින වන විට ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත රු.148,867 ක මුදලක් ගෙවා තිබුණි. 2016 අගෝස්තු 10 දින වන විටත් ප්‍රතිලාභීන් 18 දෙනෙකුට ජලමනු ලබාදී නොතිබුණි.

(iii) තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ 2014 වර්ෂයේ විමධ්‍යගත සංවර්ධන වැඩසටහන යටතේ බෝදාගම වසමේ පවුල් 14 ක් සඳහා ජල මීටර් ලබා දීම වෙනුවෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත 2014 දෙසැම්බර් 18 දින රු.350,000 ක් ගෙවා තිබුණද, 2016 අගෝස්තු 04 දින වන විටත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(iv) මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ 2009 හා 2011 වර්ෂවලදී ජාතික සවිය ගම නැගුම වැඩසටහන යටතේ කවුඩාව මහවෙල අමුණ හා ඇල මාර්ගය ප්‍රතිසංස්කරණය සඳහා කොන්ත්‍රාත්කරුට රු.2,375,231 ක් ගෙවා තිබුණද 2015 මැයි 18 දින ක්ෂේත්‍ර පරීක්ෂාවට අනුව ඉටු නොකළ වැඩ සඳහා රු.1,178,178 ක් ගෙවීම් කර තිබුණි.

**3.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**---------------------------------**

2015 අගෝස්තු 27 දින සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවට අනුව පහත අඩුපාඩු නිරීක්ෂණ විය.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආපනශාලාව පවත්වාගෙන යාම වෙනුවෙන් 2015 පෙබරවාරි මාසයේ සිට දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදයට අදාළව මාසික කුලිය රු. 41,000 ක් බැගින් වන පරිදි භාහිර පුද්ගලයකු සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුමේ කොන්දේසිය ප්‍රකාරව ආරක්ෂණ ඇප වශයෙන් මාස 03 ක කුලිය වූ රු.123,000 ක් තැන්පත් කර නොතිබූ අතර මැයි මාසය දක්වා ආපනශාලා කුලී රු.102,500 ක් අයකරගෙන නොතිබුණි.

(ආ) මැදගම දිවි නැගුම කාර්යාලය විසින් 2015 වර්ෂයේ දිවි නැගුම ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ රජයේ දායකත්වය සියයට 90 ක් හා සියයට 40 ක් වනසේ වසම් 30 ක ප්‍රතිලාභීන් සඳහා රු.1,434,125 ක් ගෙවා පැළ තවානක් වෙතින් ගම්මිරිස් පැළ 50,000 ක් මිලදී ගෙන තිබුණි. මොනරාගල අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගම්මිරිස් පැළයක සහතික මිල රු.23 ක් වුවද රු.35 ක් බැගින් පෞද්ගලික ආයතනයකින් මිලදී ගැනීම නිසා රු.600,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2015 වර්ෂයේ සියයට 90 ක් හා සියයට 40 ක් වශයෙන් රජයේ දායකත්වය ලබා දී ජීවනෝපාය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දිවි නැගුම ශාඛාව ප්‍රතිලාභීන් වෙත ලබා දීම සඳහා ගම්මිරිස් පැළයක් රු.30 ක් බැගින් පැළ 10,150 ක් මිලදී ගැනීම සඳහා රු.257,250 ක් පෞද්ගලික සැපයුම්කරුවෙකු වෙත ගෙවා තිබුණි. එම සැපයුම්කරු විසින් 2016 පෙබරවාරි 17 දින වන විටත් ගම්මිරිස් පැළ සපයා නොතිබුණි.

(ඈ) මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2015 දිවි නැගුම ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රතිලාභීන්ට ලබා දීම සඳහා එකක් රු.13,200 ක් බැගින් ලීටර් 1000 හයිබ්‍රීඩ් ජල ටැංකි 15 ක් රු.475,000 කට පෞද්ගලික ආයතනයකින් ලබා ගැනීම සඳහා ගෙවීම් කර තිබුණි. ක්ෂේත්‍ර පරීක්ෂාවට අනුව ප්‍රතිලාභීන් වෙත හයිබ්‍රිඩ් ජල ටැංකි වෙනුවට Antonmax වර්ගයේ ජල ටැංකි බෙදා දී තිබුණු බව නිරීක්ෂණය විය.

## 3.9 අවිධිමත් ගනුදෙනු

---------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2015 වර්ෂයේ දින 09 කදී රු. 3,269,280 ක් වටිනා මිලදී ගැනීම්වලට අදාළව ප්‍රසම්පාදන කමිටුවක් වශයෙන් රැස්වී තීරණ ගත් බවට සඳහන් වුවද පැමිණීමේ ලේඛනය හා ඉටුකළ වැඩසටහන් අනුව ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකයින් එම දිනවල කාර්යාලයේ රැඳී නොසිට බැහැර රාජකාරීවල නිරත වී තිබුණි.

(ආ) 2014 වර්ෂයේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත බුත්තල හා වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පානීය ජල නල පද්ධති දීර්ඝ කිරීමේ ව්‍යාපෘති සඳහා ජලනල හා උපාංග මිලදී ගැනීම වෙනුවෙන් අවස්ථා 05 කදී පෞද්ගලික සමාගමක් වෙත රු. 20,980,250 ක් ගෙවා තිබුණි. මෙම මිලදී ගැනීම සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 මාර්ගෝපදේශය ප්‍රකාරව ජාතික තරගකාරී ලංසු කැඳවීමක් සිදු නොකර දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් සීමිත මිල ගණන් කැඳවීමකින් සැපයුම්කරු තෝරාගෙන තිබුණි.

(ඇ) මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා 350KVA විදුලි ජනන යන්ත්‍රයක් මිලදී ගෙන සවිකිරීම සඳහා 2014 හා 2015 වර්ෂවලදී පෞද්ගලික සමාගමක් වෙත අවස්ථා 03 කදී රු. 9,595,924 ක් ගෙවා තිබුණි. එම මිලදී ගැනීම වෙනුවෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 මාර්ගෝපදේශය ප්‍රකාරව ජාතික තරගකාරී ලංසු කැඳවීමක් සිදු කර නොතිබූ අතර සීමිත මිල කැඳවුම් මගින් සැපයුම්කරු තෝරාගෙන තිබුණි.

## 3.10 පාඩු හා හානි

2015 ඔක්තෝබර් 22 දින වන විට වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු ජල බවුසරයක වින්ස්ක්‍රීනය බිඳීම සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ පවත්වා නොතිබුණු අතර එය කාර්යාල භූමියේ ගාල්කර තිබුණි.

## 3.11 අනාර්ථික ගනුදෙනු

2014 වර්ෂයේ එක් ගමකට එක් වැඩක් වැඩසටහන යටතේ මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මීයනකඳුර ගල්හිදමුල්ල ජල යෝජනා ක්‍රමය වෙනුවෙන් රු. 994,073 ක් වැය කර පොදු අයිතිය තහවුරු කර ගැනීමකින් තොරව පෞද්ගලික ඉඩමක ජල ටැංකි රඳවනයක් ඉදිකර තිබුණි.

## 3.12 විසඳා නොතිබුණු විගණන ඡේද

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2006 | 8.7.2 (අ)(i) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 හා 3.9.2 මාර්ගෝපදේශ අනුගමනය නොකර තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු. 1,950,000 ක් වියදම් කර අලෙවි කුටි 26 ක් ඉදිකිරීමේ දී උප කොන්ත්‍රාත්තුවක් ලබා දීම සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරී/ ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගෙන් වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. |
| 2008 | 10.4 (ඊ)(i) | 2006/2007 වර්ෂවල ගම නැගුම වැඩසටහන යටතේ බෝපිටිය, තෙනගල්ලන්ද, වෙහෙරගල හා කහම්බාන ජන සභා කාර්යාල ඉදිකිරීමේ දී සිදුවී ඇති අඩුපාඩු හා අක්‍රමිකතා සම්බන්ධයෙන් පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| 2010 | 4.7 (i) | 2002 වර්ෂයේ දී වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කැබ් රථයක් අනතුර ලක්වීමෙන් රු.375,000 ක අලාභ හානියක් සිදු වී තිබුණි. එම අලාභහානියෙන් රු.362,500 ක් 2016 ජුලි 31 දින වන විට ත් අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගෙන නොතිබුණි. |

## 3.13 කළමනාකරණ දූර්වලතා

---------------------------

නියැදි විගණන පරීක්ෂණ වලදී පහත සඳහන් දූර්වලතා නිරීක්ෂණය විය.

(අ) සියඹලාණ්ඩුව සහ ඇතිමලේ ජනපදයේ ග්‍රාම නිලධාරී වසම් වල දීර්ඝ කාලීන ඉඩම් බලපත්‍රලාභීන් 16 දෙනෙකුගෙන් දිගුකාලීන බදු ක්‍රමය යටතේ වාණිජ කටයුතු සඳහා ලබා දී තිබූ ඉඩම් වලින් 2016 පෙබරවාරි 29 දින වන විට රු. 8,746,969 ක හිඟ බදු අයකර ගෙන නොතිබුණි.

(ආ) මුතුකණ්ඩිය ජනපදයේ බදුකරුවන් 36 දෙනෙකු වෙත 2003 වර්ෂයේ දී වෙන්දේසි ක්‍රමය යටතේ වාර්ෂිකව රු. 800 ක බදු මුදලකට ලබාදුන් ඉඩම් වෙනුවෙන් 2016 පෙබරවාරි 29 දින වන විට රු. 200,000 ක මුදලක් අයකරගෙන නොතිබූ අතර එම බදුකරුවන් වෙනුවෙන් දිගුකාලීන බදුකර පිළියෙළ කිරීමටද පියවර ගෙන නොතිබුණි.

(ඇ) සියඹලාණ්ඩුව සහ මොනරාගල දිවි නැගුම කාර්යාල මගින් 2014 වර්ෂයේ දී දිවි නැගුම ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ ග්‍රාම නිලධාරී වසම් 72 ක ප්‍රතිලාභීන් 763 ක් වෙත රු. 12,871,352 ක රාජ්‍ය දායකත්වයක් දෙමින් ස්වයංරැකියා ආරම්භ කිරීමට ආධාර ලබාදීමේ කටයුතු වෙනුවෙන් දිවි නැගුම සංවර්ධන නිලධාරීන්ට රු.453,995 ක ගමන් වියදම් සහ සංයුක්ත දීමනා ගෙවා තිබුණි. එම නිලධාරීන් විසින් ඒපිළිබඳව පසුවිපරම් කළ බව සනාථ කිරීම සඳහා වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අංක 04 දරන පරිපාලන නිලධාරී සඳහා උපලේඛන ගත රජයේ නිවාසය 2003 වර්ෂයේ සිට නියෝජ්‍ය අමාත්‍යවරියකගේ සම්බන්ධීකරණ කාර්යාලයක් පවත්වාගෙන යාමට ලබාදී තිබූ නමුත් 2016 ජූලි 31 දින වන විටත් කුලී අයකර ගැනීම සිදු කර නොතිබුණි. මෙම නිල නිවස වෙනුවෙන් 2016 මාර්තු 04 දිනට ගෙවිය යුතු වූ ජල බිල්පත්වල වටිනාකම රු.214,806 ක් වී තිබුණි.

**3.14** **මානව සම්පත් කළමනාකරණය**

**------------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**----------------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** | **අතිරික්ත සංඛ්‍යාව** |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 44 | 35 | 09 | - |
| (ii) | තෘතියික මට්ටම | 23 | 02 | 21 | - |
| (iii) | ද්විතියික මට්ටම | 792 | 682 | 110 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 107 | 96 | 18 | 7 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 02 | - | 02 | - |
| | **එකතුව** | **968** | **815** | **160** | **7** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සෙවනගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පරිපාලන නිලධාරී තනතුර වසර 12 ක සිට පුරප්පාඩුව පැවතුණි.

(ආ) වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර සැලසුම් අධ්‍යක්ෂ තනතුර වසර 01 ක සිටද, පරිපාලන නිලධාරී තනතුර වසර 12 ක සිටද, පරිපාලන ග්‍රාම නිලධාරී තනතුර වසර 06 ක සිටද, තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුර වසර 07 ක සිටද පුරප්පාඩු පැවතුණි.